සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# නර්තනය

7 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය වනුයේ,

(i) දෙවොල් මඩු ශාන්ති කර්මයයි. (ii) පහන් මඩු ශාන්ති කර්මයයි.

(iii) කොහොඹා කංකාරි ශාන්ති කර්මයයි. (iv) පහන් මඩු ශාන්ති කර්මයයි.

02 උත්සහය නැමති භාවයෙන් නිරූපණය වන්නේ,

(i) ශෘංගාර රසයයි. (ii) වීර රසයයි. (iii) කරුණා රසයයි. (iv) භයානක රසයයි.

03 ''පුටුව සරසලයි මම සැල කරන්නේ'' යන ගී පාදය

(i) කුළු කව්වලට අයත් ය. (ii) තලමල වරුණ කව්වලට අයත් ය.

(iii) මල් යහන් කව්වලට අයත් ය. (iv) තාලම් කව්වලට අයත් ය.

04 අද වෙස්සන්තර රාජ පුනා ගිතයේ පද රචනය කරනු ලැබුවේ,

(i) මර්සලින් ජයකොඩි පියතුමා (ii) නීතීඥ ජෝන් ද සිල්වා ශූරීන්

(iii) සුනිල් හාන්ත මහතා (iv) බී. ඇස්. පෙරේරා මහතා

05 තුරගා වන්නමේ තාල රූපය වනුයේ,

(i) මාත්‍රා 3 + 3 තනි තිතේ තාල රූපයටයි. (ii) මාත්‍රා 4 + 4 තනි තිතේ තාල රූපයටයි.

(iii) මාත්‍රා 3 + 4 දෙතිතේ තාල රූපයටයි. (iv) මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපයටයි.

- **ප්‍රශ්න අංක 06 - 10 තෙක් ඇති ප්‍රශ්නවල වරහන් තුළ දී ඇති ඉතා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

( මාත්‍රා 2 +4 / විනෝදාස්වාදය / දූඩි භක්තිය / දැල අඩියයි / දවුල )

06 ........................................................................................ සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.

07 පස්වන පා සරඹයේ සරඹ නාමය වනුයේ .................................................................................................. අඩියයි.

08 ගිනි පෑගීම, බිම පෙරළීම, කටු ගැසීම ආදි දුෂ්කර කාර්යයන්හී නියැලෙන්නේ දෙවියන් වෙනුවෙන් ......................................................... ප්‍රකාශ කිරීම සඳහාය.

09 උඩරට වන්නම් හා සබරගමු වන්නම් ........................................................ අරමුණු කොටගෙන රචනා වී ඇත.

10 දොං දොං ජිං ජිං ගජිගත යන බෙර පදය මාත්‍රා .................................................................... ප්‍රස්තාර කළ හැක.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11 වැස්ස තේමා කරගත් නිර්මාණ ගොඩනැගීමේ ක්‍රියාකාරකම විකල්ප වාද්‍ය භාණ්ඩ වලින් කළ හැක. ( )

12 පාද චලන හුරු කර ගැනීම සඳහා මූලික සරඹ වශයෙන් ගොඩ සරඹ නටනු ලැබේ. ( )

13 සිදුහත් කුමාරයාගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳ සිද්ධිය තුරඟා වන්නමෙන් කියවේ. ( )

14 මාරි අම්මාන් හා ගංගා අම්මාන් දෙවිවරු 'කරගම්' නැටුමේ පුද ලබයි. ( )

15 නර්තනයේ දී තාලම්පට ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයක් නොවේ. ( )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට A තීරුවේ ගැලපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A තීරුව | | B තීරුව |
|---|---|---|---|
| 16 | දමිළ නර්තන අංගයකි. | * | ජේ. ඊ. සේදරමන් මහතා |
| 17 | උඩරට නර්තන ශිල්පියෙකි. | * | තුරඟා වන්නම |
| 18 | දොං ජිංත ගත දොංත | * | ටින් බෙරය |
| 19 | විකල්ප වාද්‍ය භාණ්ඩයකි. | * | අල්ලා දෙවියන් |
| 20 | රාමසාන් උත්සවය | * | කාවඩි |

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

01 ''උඩරට නර්තන සම්ප්‍රදායේ කොෂ්ඨාගාරය කොහොඹා කංකාරි ශාන්ති කර්මයයි.'' ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය පිළිබඳ රැස්කරගත් තොරතුරු අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) කොහොඹා කංකාරි ශාන්ති කර්මය පැවැත්වීමේ අතීත හේතුව හා වර්තමාන හේතු ලියන්න. (ලකුණු 03)

(ii) මෙහි පුද ලබන දෙවිවරු නම් කරන්න. (ලකුණු 03)

(iii) කප් සිටුවීම, අස්නේ, මඩුපේ කිරීම, නමස්කාර, ශ්ලෝක, මඟුල් බෙර, යක්කම්, පිං බෙර, වැදුම් අත්, ගුරුගේ මාලාව, ගබඩාකොල්ලය, ආවැන්දුම යන යෙදුම් පහත සඳහන් වගුවේ නිවැරදි ස්ථානවල ලියන්න. (ලකුණු 04)

| චාරිත්‍ර විධි | නර්තන අංග | ගායන | වාදන | නාට්‍යම අවස්ථා |
|---|---|---|---|---|
| | | | | |

02 ''ගීතවලට නර්තනය කිරීම තුළින් නිර්මාණශීලීත්වය වර්ධනය වේ. ඔබ පංතිකාමරයේ දී නර්තන නිර්මාණය සඳහා යොදාගත් ගීතය අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ නිර්මාණය සඳහා යොදාගත් ගිතයේ මුල් කොටස ලියන්න. (ලකුණු 03)

(ii) එම ගීතය පදරචනය හා ගිත ගායනය කළ දෙදෙනාගේ නම් ලියන්න. (ලකුණු 03)

(iii) එම ගිතය ශ්‍රවණ කිරීමේ දි ඔබට දැනුණ අදහස් දෙකක් ලියන්න. (ලකුණු 04)

03 ''විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම 'කතරගම' දේවාල පෙරහැරෙන් ඉස්මතුවේ.'' එම පෙරහැර ආශ්‍රයෙන් පහත සඳහන් කාර්ය පත්‍රිකාව පුරවන්න.

| | | | |
|---|---|---|---|
| (i) | පැවැත්වීමේ හේතු | 1. ............<br>2. ............<br>3. ............ | (ලකුණු 04) |
| (ii) | පෙරහැරේ නර්තන අංග | 1. ............<br>2. ............<br>3. ............ | (ලකුණු 04) |
| (iii) | පෙරහැරේ දක්නට ලැබෙන වාදන භාණ්ඩ | 1. ............<br>2. ............ | (ලකුණු 02) |

04 පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. ගොඩ සරඹ
2. නමස්තා අභ්‍යාස
3. ගැමි නැටුම්
4. ජේ. ඊ. සේදරමන් මහතා

05 ''ජන ගායනා මිනිසාගේ හුදු විනෝදාස්වාදය සඳහා නිර්මාණය වී ඇත.

(i) ජන ගායනාවල සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) මල් යහන් කවියක් ලියන්න. (ලකුණු 03)

(iii) ජන ගායනාවල සමාජ සංස්කෘතික හා සාහිත්‍යමය වටිනාකමක් ඇත. ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන් බිත්ති පුවත්පතට සුදුසු ලිපියක් ලියන්න. (ලකුණු 04)

| 7 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය 2018 | නර්තනය |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | iii | 06 | දවුල | 11 | ✓ | 16 | කාවඩි |
| 02 | ii | 07 | දෑල අඩියයි | 12 | X | 17 | ජේ. ඊ. සේදරමන් මහතා |
| 03 | iii | 08 | දෑඩි භක්තිය | 13 | ✓ | 18 | තුරඟා වන්නම |
| 04 | ii | 09 | විනෝදාස්වාදය | 14 | ✓ | 19 | ටින් බෙරය |
| 05 | iv | 10 | මාත්‍රා 2 + 4 | 15 | X | 20 | අල්ලා දෙවියන් |

(1 x 20 = 20)

## II කොටස

01 (i) <u>අතීත හේතුව</u>
පඬුවස්දෙව් රජුට වැළඳුණු දිව්දොස් නිසා හටගත් රෝගය සුවපත් කිරීම
<u>වර්තමාන හේතුව</u>
ධන ධාන්‍ය, ගව මහිෂාදි, භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනිමට / රෝගාබාධ සුවපත් කර ගැනිමට / ගමට, ප්‍රදේශයකට, මුළු රටටම සෙත් ශාන්තියක් ලබාගැනීම (ව්‍යසන අවස්ථාවන්හිදී) / අධ්‍යාපන අවස්ථාවන් සඳහා (ලකුණු 03)

(ii) <u>පුද ලබන දෙවිවරු</u>
කොහොඹා දෙවියෝ, අලුත් කොහොඹා, මහ කොහොඹා, පරණ කොහොඹා, කොහොඹා දෙව් තුන් කට්ටුව (ලකුණු 03)

(iii)

| චාරිත්‍ර විධි | නර්තන අංග | ගායන | වාදන | නාට්‍යම අවස්ථා |
|---|---|---|---|---|
| කප් සිටුවීම<br>මඩුපේ කිරීම | අස්නේ<br>ආවැන්දුම | නමස්කාර<br>ශ්ලෝක | මඟුල් බෙර<br>පිං බෙර<br>වැඳුම් අත් | යක්කම්<br>ගුරුගේ මාලාව<br>ගබඩාකොල්ලය |

(ලකුණු 04)

02 (i) තෝරාගත් ගීතයේ මුල් කොටස ලියා ඇත්නම් ලකුණු 03 යි.

(ii) අද වෙස්සන්තර රාජ පුතා
පද රචනය - නීතිඥ ජෝන් ද සිල්වා ශූරීන් / ගීත ගායනය - ජෝන් ද සිල්වා නාට්‍ය කණ්ඩායම
වෙසක් කැකුළු ගීතය
පද රචනය - මර්සලින් ජයකොඩි පියතුමා / ගිත ගායනය - ඉන්ද්‍රාණී විජේබණ්ඩාර මහත්මිය (ලකුණු 03)

(iii) ගුරුවරයාට සුදුසු පරිදි ලකුණු ලබාදිය හැකිය. අදහස් 1 ක් ලියා ඇත්නම් ලකුණු 2 ක් ද, අදහස් දෙකම නිවැරදි ලෙස ලියා තිබේනම් ලකුණු 4 ක් ලබාදෙන්න.

03 (i) පැවැත්වීමේ හේතු
බැතිමතුන්ගේ අපල උපද්‍රව නැතිකිරීමට / දේවාශිර්වාදය හා රටට සෙත් පැතීම / වර්ෂාව හා සශ්‍රීකත්වය ලබාගැනීම / ස්වභාවික විපත් වලින් රට බේරාගැනීම (ලකුණු 03)

(ii) නර්තන අංග - කාවඩි, කොහොඹ කළය, සත්ව නර්තනය, මොණර නැටුම් ආදිය (ගැමි නැටුම් - රබන්, සවරං, චාමර, වේවැල්, ලී, කඩු)

(iii) වාදන භාණ්ඩ - දමිළ බෙරය, නාග ස්වරම් (තවිල් බෙරය)

04 1. ගොඩ සරඹ
ගොඩ සරඹ 12 ක් ඇති බව / ගොඩ සරඹවලට අත් සරඹ යැයි කියන බව / ගොඩ සරඹයක් නටා කස්තිරමක් නටන බව / එකිනෙකට වෙනස් වු කස්තිරම් ඇති බව / ගොඩ සරඹ ලය තුනට නර්තනය කළ යුතු බව / වෙනත් කරුණු ගැලපෙන සේ ලියා ඇත්නම් (ලකුණු 05)

2. නම්‍යතා අභ්‍යාස
නර්තනය සඳහා අවශ්‍ය ශාරීරික සමබරතාවය / නිවැරදි හැඩතල සකස් කර ගැනිම / මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි නිරෝගී පුද්ගලයකු වීම / මානසික සුවය ලැබීම / රසවින්දන හැකියා වර්ධනය / අභියෝගවලට මුහුණ දීම, දරාගැනීමේ හැකියා / කායික සංවර්ධනය ඇතිවීම (ලකුණු 05)

3. ගැමි නැටුම්
සරල බව / ජිවන වෘත්තීන් හා බැඳී පවතින බව / ගායනා හා උපකරණ භාවිතය / ඕනෑම වාදන භාණ්ඩ භාවිතා කළ හැකි බව / සරල ඇඳුම් පැළඳුම් භාවිතා වන බව

4. ජේ. ඊ. සේදරමන් මහතා
ප්‍රවීණ උඩරට නර්තන ශිල්පියෙකි / 1908. 09. 23 උපත ලද බව / විදේශ සංචාරය හා ඉදිරිපත් කරන නර්තන / අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ඉටුකර ඇති සේවය / ඔවුන් විසින් රචිත ග්‍රන්ථ (ආදී වශයෙන් තොරතුරු නිවැරදි ලෙස ලියා ඇත්නම්) (ලකුණු 05)

05 (i) කතෘවරයෙක් නොමැති බව / ඒ ඒ ගායනාවලට ආවේණික නාද මාලා ඇති බව ආදි වශයෙන් කරුණු තුනක් ගැලපෙන සේ හා නිවැරදි ලෙස ලියා ඇත්නම් (ලකුණු 03)

(ii) පුටුව සර සලයි මම සැළ කරන්නේ හෝ මිහින්තලේ අට සැට ලෙන සේල චෛත්‍ය වෙහෙරට හෝ වෙනත් මල් යහන් කවියක් නිවැරදි ලෙස ලියා ඇත්නම් (ලකුණු 03)

(iii) ජන ගායනාවල සමාජ සංස්කෘතික සාහිත්‍යම වටිනාකම නිවැරදිව ලියා ඇත්නම් ගුරුවරයාගේ අභිමත පරිදි ලකුණු 04 ක් ලබාදෙන්න.